## ICBS 39

# සියදිවිහානිය බෞද්ධ විනය සන්දර්භයෙහි ලා දුක්කටාපත්තියක් වන්නේ කවර පදනමක් මත ද? විමර්ශනාත්මක අධ්‍යයනයක්

**පූජ්‍ය පිංකන්දේ දමිතසාර හිමි**

*damithasara@gmail.com*

බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රය තුළ විවාදාත්මක විෂයක් ලෙස ආත්මඝාතනය (Suicide) හැඳින්විය හැකිය. සියදිවිහානිය වර්තමාන සංකීර්ණ සමාජය තුළ අපේක්ෂා භංගත්වය, දරිද්‍රතාව, පුද්ගලාන්තර සම්බන්ධතා බිඳවැටීම, විවිධ රෝගාබාධයන්ට ලක්වීම වැනි හේතු මත බහුල ව සිදුවන අතර මෙම සමාජීය ගැටලුව බුදුන් ධරමාන සමයෙහි ද සිදු වූ බවට සාක්ෂ්‍ය ත්‍රිපිටක සාහිත්‍යයෙන් හෙළිවේ. *ගෝධික, වක්කලී, ඡන්න* යන තෙරවරු සහ *මනුස්සවිග්ගහ* පාරාජිකාවට සම්බන්ධ භික්ෂූන් උක්ත සන්දර්භයෙහි ලා ඓතිහාසික වශයෙන් වාර්තා වන භික්ෂු චරිත වේ. එම භික්ෂූන්ගේ ආත්මඝාතන ක්‍රියාව සම්බන්ධයෙන් බුදුන්වහන්සේ ආර්යතුෂ්ණීම්භාවයෙන් ඉවසා සිටි අතර *පාරාජිකපාළියෙහි* මනුෂ්‍යවිග්‍රහාපත්ති විවරණයෙහි එය දුක්කටාපත්තියක් වැනි සුළු ඇවතක් වූයේ කුමන හේතු නිසාදැයි විමසීම මෙම පර්යේෂණයේ අරමුණයි. සත්ත්වයින් අතර මනුෂ්‍යයාට හිමිවන්නේ උච්චස්ථානයක් වන බැවින් භික්ෂු විනයෙහි පාරාජිකා සංඛ්‍යාවට අයත් *මනුස්සවිග්ගහ* පාරාජිකාපත්තිය භික්ෂුත්වය අහිමි වන තරම් බරපතල විනය විරෝධී ක්‍රියාවක් වෙයි. එහෙත් භික්ෂුවක් තමන්ව නසා ගතහොත් එය යටත් පිරිසෙයින් ප්‍රාණඝාතයට සම්බන්ධ අකුසල කර්මයක් ද නො වන බව පාලි මූලාශ්‍රය අධ්‍යයනයෙන් පැහැදිලි වේ. අටුවා ඇදුරෝ *ගොධික, ඡන්න, වක්කලී* යන තෙරවරුන්ගේ සියදිවි හානිකරගැනීම උත්තම ක්‍රියාවක් ලෙස නො දක්වන නමුත් එයින් උන්වහන්සේලාට ආපත්තිමය වශයෙන් හානියක් සිදුවූ බවක් ගම්‍යමාන නො කරන අතර *සමසීසී* ලෙස කෙලෙස් සහ හිස යන දෙක ම පෙර පසු නො වී ඡේදනය වූ බව පවසති. රෝගාතුර ව සිටි *ඡන්න* සහ *වක්කලී* භික්ෂූන්ගේ ශාරීරික වේදනාව ඉවසිය නො හැකි අවස්ථාවක ගත් තීරණය බුදුන් වහන්සේ පවා වැළැක්වීමට උත්සහ නො කරන ලද්දේ එය ඵලරහිත ක්‍රියාවක් බැවිනි. *ගෝධික* තෙරුන්ගේ මරණය හුදු ලෞකික පරමාර්ථයක් ඉටුකරගත නො හැකිවීම නිසා ජනිත වූ ඉච්ඡාභංගත්වයක් නො ව ආධ්‍යාත්මික පරමාර්ථයක් උදෙසා සිදුකළ ජීවිත පරිත්‍යාගයකි. රහතන් වහන්සේලාගේ ආයු සංස්කාරය අතහැරීම, පරාර්ථකාමී අදහසින් සිය ජීවිතය පූජා කිරීම බුදුසමයෙන් අනුමත කරන ලද්දේ එකී ආධ්‍යාත්මික අරමුණක් වෙනුවෙන් කරන ලද බැවිනි. එසේ ම බුදුන් වහන්සේ සියදිවි හානිකර ගැනීම භික්ෂු සමාජයේ ප්‍රබල ප්‍රශ්නයක් වශයෙන් නො සලකා ඇත්තේ දැඩි ශික්ෂාවක් පනවන්නට තරම් සිද්ධි සමූහයක් වාර්තා නො වීම යැයි නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** ආත්මඝාතනය, ජීවිත පරිත්‍යාගය, ප්‍රාණඝාතය, මනුෂ්‍යඝාතනය, *සමසීසී*